**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2017)

**පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි**
**"ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසය වෙනුවෙන් කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සහ විශේෂ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. ජනතාවගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමත්, පුස්තකාල සම්පත් හා සේවාවන් ප්‍රවර්ධනය කිරීමත් මෙම වැඩසටහන්වල අරමුණු විය යුතු වේ.

## 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැකි අතර, ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධාන - කමිටු සභාපති
- නාගරික කොමසාරිස් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති/භාරකරු - කමිටු ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක්

## 03. ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- බැනර්/උද්‍යත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම (කියවීමේ අගය ගම්‍ය වන පරිදි)
- විශේෂ තරඟ පැවැත්වීම (රචනා, චිත්‍ර, කථික, විවාද, නාට්‍ය, ගායනා, අත් අකුරු)
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- බිත්ති පුවත්පත්, සමරු කලාප, සඟරා එළිදැක්වීම
- පුස්තකාලය පිළිබඳව අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම
- ශ්‍රමදාන /පුස්තකාල අලංකරණය ආදී කටයුතු සිදු කිරීම
- පරිගණක යන්ත්‍ර හා අන්තර්ජාල සම්බන්ධතා ලබා ගැනීම
- අරමුදල් රැස්කිරීම, පොත් මිලට ගැනීම හා පරිත්‍යාග ලබා ගැනීම, පරිත්‍යාග ලබාදීම වැනි කටයුතු හා උපකරණ අලුතින් ලබා ගැනීම
- නව සාමාජිකයන් බඳවා ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම
- අන්තර්ජාලය හරහා තොරතුරු ගවේෂණයට හුරුකරවීමේ වැඩසටහන් පැවැත්වීම
- කතන්දර පැය, චිත්‍රපට හා වීඩියෝ දර්ශන ආදී විවිධ විනෝදජනක වැඩසටහන් මගින් කියවීමේ රුචිය වර්ධනය කරලීම

- කියවීම් කඳවුරු, කියවීමේ තරග සංවිධානය කිරීම
- නව සේවාවන් ආරම්භ කිරීම (ප්‍රජා තොරතුරු සේවා/ජංගම පුස්තකාල සේවා)
- පාඨක සමාජ පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම
- පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ වැඩසටහන් දියත් කිරීම
- ගවේෂණ චාරිකාවල යෙදීම හා ගමන් සංවිධානය කිරීම
- සාම්ප්‍රදායික පත්‍රිකා සූචියක් නොමැති නම්, පරිගණක ආශ්‍රයෙන් සරල දත්ත පදනමක් නිර්මාණය කිරීම (පුස්තකාල මෘදුකාංගයක් හෝ Excel මෘදුකාංගය භාවිතයෙන්)
- පුස්තකාලය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම හෝ තිබෙන වෙබ් අඩවිය නිර්මාණාත්මක ලෙස සකස් කිරීම
- පුස්තකාල සාමාජිකත්වය වර්ධනය කිරීම සඳහා එක්දින වැඩසටහනක් සංවිධානය කිරීම
- පළාතේ අනෙකුත් පුස්තකාල සමඟ කියවීම් ප්‍රවර්ධන සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම
- පළාත් පාලන බල ප්‍රදේශය තුළ සෑම නිවසකම ආලින්දයේ අවම වශයෙන් පොත් රාක්කයකින් සමන්විත පුස්තකාලයක් ආරම්භ කිරීමේ සංකල්පය තහවුරු කිරීම සඳහා ස්ටිකර්, පෝස්ටර්, අත්පත්‍රිකා නිර්මාණය කර බෙදා හැරීම
- නව තොරතුරු සේවාවක් ආරම්භ කිරීම (ලියාපදිංචි පාඨකයන්ට පොත් ලැයිස්තු යැවීම, පළාත් පාලන බල ප්‍රදේශයේ වැදගත් ස්ථානවල තොරතුරු එකතුවක් නිර්මාණය කර ජනතාව අතර බෙදා හැරීම)
- මුහුණු පොතට සම්බන්ධ වී සිටින පාඨකයන් හඳුනා ගෙන අනෙකුත් අය මුහුණු පොතට සම්බන්ධ කර ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- ඉටු කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කිරීම (පුවත්පත්)
- කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම කළ යුතු නොවේ. පළාත් පාලන ආයතනයේ පොදු මුදලින් කොටසක්ද, පුස්තකාල අරමුදලින් කොටසක් ද යෙදවීම ප්‍රමාණවත් වන අතර කමිටුව මඟින් ව්‍යාපෘති වාර්තා සම්පාදනය කර රාජ්‍ය ආයතන, බැංකු, සිවිල් සංවිධාන, ප්‍රදේශයේ දානපතියන්, ව්‍යාපාරිකයන් වෙත ඉදිරිපත් කර මූල්‍ය අනුග්‍රහය ලබාගැනීම සුදුසු ය.

## 05. ඇගයීම

සිදු කරන ලද සියලු වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් ඡායාරූප හා වෙනත් සාධක සහිතව (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2018 ජනවාරි මස 31*** වන දිනට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට යොමු කළ යුතුය.

ජාතික කියවීමේ මාසයේ ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2017 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන නිසා එක් පළාත් පාලන ආයතනයක් සතු මහජන පුස්තකාල වෙන වෙනම වාර්තා එවිය යුතුය.

ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ
සභාපති

විමසීම් - දුරකථන අංකය - 011-2698847, ෆැක්ස් 011-2674387, වෙබ් අඩවිය - www.natlib.lk